ජාතික ආරක්ෂක විද්‍යායතනයේ ප්‍රධාන ගොඩනැගිල්ල ජනපති අතින් විවෘත වෙයි

ජාතික ආරක්ෂක විද්‍යායතනයේ ප්‍රධාන ගොඩනැගිල්ල ඊයේ (11දා) ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා අතින් විවෘත විය. ජාතික ආරක්ෂක විද්‍යායතනයේ නිල වෙබ් අඩවිය එළිදැක්වීමද ජනාධිපතිවරයා අතින් සිදු කෙරිණි.

චීන රජය අංග සම්පූර්ණ ශ්‍රවණාගාරයක් හා පකිස්තාන රජය මෙම ජාතික ආරක්ෂක විද්‍යායතනයේ පුස්තකාලයක් ඉදිකිරීමට දායකත්වය සපයා ඇති අතර, පුස්තකාලය සඳහා පොත් ලබාදීම ඕස්ට්‍රේලියානු රජය හා ත්‍රිවිධ හමුදාව විසින් සිදු කර තිබේ.

ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂක විද්‍යායතනය පිහිටුවීම දිගුකාලීන අවශ්‍යතාවක ඉටු වීමක් බව ජනාධිපති රාජපක්ෂ මහතා උත්සව සභාව අමතමින් සඳහන් කළේය.

ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීන්ට ක්‍රමෝපායික අධ්‍යාපන අවස්ථා ලබාගැනීම සඳහා විදේශ අධ්‍යාපන ආයතනවල පවතින අවස්ථා සෙවීම හැර වෙනත් විකල්පයක් නොතිබූ බවත්, සෑම වසරකම මිත්‍ර ජාතීන් පිරිනමනු ලබන පාඨමාලා නිලධාරීන් කිහිපදෙනෙකුට විශාල ප්‍රතිලාභයක් සැලසුවද, තවත් බොහෝ පිරිසකට අවස්ථාව අහිමි වූ බවත් ජනාධිපතිවරයා එහිදී පෙන්වා දුන්නේය.

මෙම අවස්ථාවට ජනාධිපති ප්‍රධාන උපදේශක ලලිත් වීරතුංග, ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න, තානාපතිවරු සහ මහ කොමසාරිස්වරු, ත්‍රිවිධ හමුදාපතිවරු, පොලිස්පති, විශ්වවිද්‍යාල කුලපතිවරු සහ උපකුලපතිවරු ඇතුළු පිරිසක් එක්ව සිටියහ.

පසු කෝවිඩ් තත්ත්වය ජයගන්නා අයවැයක්

2022 අයවැය ලේඛනයට නව තාක්ෂණය හා මුසුකොට රට සංවර්ධනය කරා රැගෙන යාම ඉලක්ක කළ යෝජනා ඇතුළත්

- මුදල් අමාත්‍යාංශය පවසයි

● **සමිල පෙරේරා**

2022 වසර සඳහා වන අයවැය ඇස්තමේන්තුව මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා විසින් අද (12දා) පස්වරු 2.00ට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතය. නිදහස් ශ්‍රී ලංකාවේ 76වැනි අයවැය ලේඛනය වන මෙය වත්මන් ආණ්ඩුවේ දෙවැනි අයවැය සහ මුදල් අමාත්‍යවරයා ලෙස බැසිල් රාජපක්ෂ මහතා ඉදිරිපත් කරනු ලබන පළමු වැනි අයවැය ලේඛනයද වෙයි.

වෙළෙඳපොළ ආර්ථිකය නිෂ්පාදන ආර්ථිකයක් බවට පරිවර්තනය කර ගැනීම සඳහා වන විධිමත් වැඩපිළිවෙළක් යටතේ විය සකස් කර ඇති බව පවසන මුදල් අමාත්‍යාංශය, ඒ සඳහා වන ක්ෂේත්‍ර හඳුනා ගනිමින් නව තාක්ෂණය හා මුසුකොට රට සංවර්ධනය කරා රැගෙන යාම ඉලක්ක කරගත් යෝජනාද මෙවර අයවැය ලේඛනයට ඇතුළත් වනු ඇති බව කියයි.

එසේම ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීමේ වාසිය රටේ ආර්ථිකය ශක්තිමත් කරලීම සඳහා යොදා ගැනීම සේම, මුහුණපා සිටින විදේශ විනිමය ගැටලුව අවම කිරීම සඳහා වන ක්‍රියාමාර්ගද 2022 වසරේ අයවැය ලේඛනයට ඇතුළත් වන බවද පෙන්වා දෙයි. විශේෂයෙන්ම, පසු කොවිඩ් තත්ත්වයට සාර්ථකව මුහුණ දෙමින් ආර්ථිකය යථාවත් කිරීමේ යෝජනා රැසක්ද මෙවර අයවැය ලේඛනයට ඇතුළත් වනු ඇති බව මුදල් අමාත්‍යාංශය වැඩිදුරටත් පවසයි.

2022 වසර සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත පසුගිය ඔක්තෝබර් මස 07දා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. ඒ අනුව 2022 වසරේ රටේ සමස්ත වියදම රු.බිලියන 5,128ක් පමණ වේ. ඊට රාජ්‍ය සේවය වැටුප්, සහනාධාර, සුබ සාධන, ණය පොලී ආපසු ගෙවීම්, සංවර්ධන ආයෝජන සඳහා වන වියදම් ඇතුළත්ය.

අයවැය දෙවැනි වර කියවීමේ විවාදය 13 වැනි සෙනසුරාදා ආරම්භ කෙරේ. 22 වැනි අඟහරුවාදා පස්වරු 5.00ට අයවැය දෙවැනි වර කියවීමේ ඡන්ද විමසීම පැවැත්වේ. අයවැය තුන්වැනි වර කියවීම හෙවත් කාරක සභා අවස්ථා විවාදය ආරම්භ වන්නේ 23 වැනි අඟහරුවාදාය. දින 16ක් විවාද කිරීමෙන් අනතුරුව දෙසැම්බර් මස 10 වැනිදා පස්වරු 5.00ට අයවැය තුන් වැනි වර කියවීමේ ඡන්ද විමසීම පැවැත්වේ.

පොහොර ගැටලුව දැන් ගොවීන්ගේ ඒත් මාස 2කින් එය පාරිභෝගිකයාගේ

- සමස්ත ලංකා ගොවිජන සම්මේලන

● **ඉන්දික සේවාවිතාරණ**

පොහොර ගැටලුව තවමත් ගොවීන්ගේ ගැටලුවක් පමණක් බවත්, එහෙත් තවත් මාස දෙකක් පමණ ගත වනවිට එය පාරිභෝගික ප්‍රශ්නයක් බවට පත් වන බවත් සමස්ත ලංකා ගොවිජන සම්මේලන සඳහන් කරයි.

පොහොර නොමැති වීම නිසා වී වගාව ආරම්භ කිරීමට නොහැකි වීමේ ගැටලුව පිළිබඳ මේ වනවිට රට තුළ සංවාදයක් ඇති වී තිබෙන බවත්, එහෙත් පොහොර ගැටලුව එළවළු, පලතුරු, බුලත් හා බඩඉරිඟු වගාව මල් වගාවට සේ, කුරුඳු වගාවන්වලටත් විශාල ලෙස බලපා තිබෙන බවත් එම සංවිධානයේ ජාතික සංවිධායක නාමල් කරුණාරත්න මහතා පැවසීය. මේ නිසා එළවළු වගාවට ඇති වී තිබෙන පොහොර ගැටලුව මුලික කර ගනිමින් විරෝධතා ව්‍යාපාර පැවැත්වීමට කටයුතු කරන බවත්, මේ අනුව අද බණ්ඩාරවෙල නගරයේදී එළවළු ගොවියා මුලික කර ගනිමින් විරෝධතා ව්‍යාපාරයක් සිදුකරන බවත් හෙතෙම පවසා සිටියේය. එළවළු, පලතුරු වගාවන්ට ඇති වී තිබෙන ගැටලුව තුළින් සිදුවන්නේ, එළවළු, පලතුරු හිඟ වීම හා මිල ඉහළයාම බවත්, එවැනි තත්ත්වයක් ඇති වුවහොත් එය මේ රටේ පාරිභෝගික ජනතාවගේ ගැටලුවක් බවට පත් වන බවත් නාමල් කරුණාරත්න මහතා ප්‍රකාශ කළේය. මල් හා බුලත් වගාව සැලකීමේදී විදේශ රටවලට විකුණා දමා ඩොලර් ආදායම් ලබා ගන්නා බවත්, පවතින පොහොර ගැටලුව නිසා එම වගාවන්ටත් මෙය බලපා තිබෙන බවත් ඒ මහතා පවසා සිටියේය.

පොහොර සම්බන්ධයෙන් මේ ආකාරයට රට තුළ විශාල ගැටලුවක් ඇති වී තිබුණද, ඒ සඳහා මෙතෙක් ස්ථිර විසඳුමක් ලැබී නොමැති බවද නාමල් කරුණාරත්න මහතා සඳහන් කළේය.

පුහුණුව අවසන් අභ්‍යාසලාභීන් ස්ථිර කිරීම කල් දැමීමට ප්‍රකාශ නිකුත්වෙමින් තිබෙනවා

- ඒකාබද්ධ සංවර්ධන නිලධාරී සේවා සංගමය

● **එච්.අයි. කුමාර**

වසරක පුහුණුව අවසන් වූ අභ්‍යාසලාභීන් ස්ථිර කරන ලෙස රට තුළ විරෝධතා ආරම්භ කර තිබියදී මෙම පිරිස් ස්ථිර කිරීම කල් දැමීම සඳහා ආණ්ඩුවේ පිරිස් මේ වනවිට විවිධ ප්‍රකාශ සිදුකරමින් තිබෙන බව ඒකාබද්ධ සංවර්ධන නිලධාරී සේවා සංගමය සඳහන් කරයි.

රජයක් යනු රැකියා ලබාදෙන ස්ථානයක් නොවන බවට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පවා මේ වනවිට ප්‍රකාශ සිදුකරමින් තිබෙන බවත්, එහෙත් අභ්‍යාසලාභීන් පනස් තුන්දහස වසරක පුහුණුවෙන් පසු ස්ථිර කිරීම සඳහා බඳවා ගත්තේ, එතුමාගේ යෝජනාවකට අනුව බවත් එම සංගමයේ ලේකම් ධම්මික මුණසිංහ මහතා පැවසීය.

මේ වසරේ සැප්තැම්බර් 02වැනිදා වනවිට උපාධිධාරීන් පනස්තුන්දහසේ වසරක පුහුණුව අවසන් වූ බවත්, මේ නිසා ආණ්ඩුවට සිදුකිරීමට තිබෙන්නේ, ස්ථිර කිරීම පිළිබඳ විවිධ කතා කිරීම් නවතා ලබාදී තිබෙන පොරොන්දුව ඉටුකිරීම බවත් ඒ මහතා පවසා සිටියේය.

එසේ නොමැතිව ස්ථිර කිරීම කල් දැමීමට කටයුතු කළහොත් ඒ වෙනුවෙන් මුලින්ම දිස්ත්‍රික් මට්ටමින් මහා පාරේ සටන් ආරම්භ කිරීමට තීරණය කර තිබෙන බවත්, දිස්ත්‍රික් මට්ටමින් විරෝධතා පැවැත්වීමට අමතරව ජාතික මට්ටමේ විරෝධතා පවත්වන ආකාරය පිළිබඳ ඉදිරි දිනවල සාකච්ඡා ආරම්භ කරන බවත් ලේකම්වරයා සඳහන් කළේය.

රටේ උගත් පිරිස පවතින පුරප්පාඩු සඳහා යොමුකර ස්ථිර කිරීම කල් දැමීමට ආණ්ඩුව උත්සාහ කළත්, දේශපාලන හිතවත්කම් මත බඳවා ගන්නා පිරිස්වල අවශ්‍ය පහසුකම් සැලසීමට ආණ්ඩුව විශාල උනන්දුවක් දක්වන බවද ධම්මික මුණසිංහ මහතා ප්‍රකාශ කළේය.

අද Business

පිට පිටම සිව්වන වසරටත් කොමර්ෂල් බැංකුව ඇගයීමට

ශ්‍රී ලංකා ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය (ICCSL) කළමනාකරණ ගණකාධිකාරීන්ගේ වරලත් ආයතනය (CIMA) සමඟ එක්ව වාර්ෂිකව පවත්වන සම්මාන ප්‍රදානෝත්සවයේදී කොමර්ෂල් බැංකුව ශ්‍රී ලංකාවේ වඩාත්ම ඇගයීමට පාත්‍ර වූ සමාගම් 10 අතරට නැවත වතාවක් තේරී පත්වීමට පසුගියදා සමත්විය.

මෙම ඇගයීමට ලක් වූ ලැයිස්තුවේ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සමාගම් 10 අතරට කොමර්ෂල් බැංකුව පිට පිටම තේරී පත්වූ සිව්වන අවස්ථාව මෙය වේ. මෙම සම්මානය ශ්‍රී ලංකාව සඳහා ඉන්දියානු මහ කොමසාරිස් ගෝපාල් බග්ලේ මහතා අතින් කොමර්ෂල් බැංකුවේ අධ්‍යක්ෂිකාවක වන තිරෝමාල් කුරේ මහත්මිය, බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මානව සම්පත් කළමනාකරණ, ඉසුරු තිලකවර්ධන මහතා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවිකරණ, හස්රත් මුණසිංහ මහතා විසින් භාරගන්නා ලදී. මෙම අවස්ථාවට කොළඹ පුරපතිනිය වන රෝසි සේනානායක මහත්මියද සහභාගී විය.

මිණිමුතු අධ්‍යාපන සැලසුම් සමඟින් දරුවන්ට සුරක්ෂිත අනාගතයක්

රක්ෂණ ආයතන විසින් පාරිභෝගිකයන් සඳහා ලබාදෙන රක්ෂණ විසඳුම් අතරින් රැකවරණය මෙන්ම ආයෝජන ප්‍රතිලාභද ලබාදෙන අධ්‍යාපන සැලසුම් සුවිශේෂී රක්ෂණ විසඳුමක් ලෙස සැලකේ.

අධ්‍යාපන සැලසුම් දිගු කාලීන ආයෝජනයක් ලෙස සැලකෙන අතර දෙමව්පියන්ට සිය දරුවන් සඳහා මූල්‍යමය වශයෙන් සුරක්ෂිත අනාගතයක් ගොඩනැගීම සඳහා සහය වෙයි.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල 15 ක සංඛ්‍යාවක් පවතින නමුත් විශ්වවිද්‍යාලවල පවත්නා සීමිත ධාරිතාව හේතුවෙන් සෑම වසරකම විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටින 350,000ක සිසුන් ප්‍රමාණය අතරින් වාර්ෂිකව ඇතුළත් කරගනු ලබන්නේ සිසුන් 30,000 ක් පමණි. වාර්ෂිකව ශ්‍රී ලාංකික සිසුන් 12,000ක් පමණ උසස් අධ්‍යාපනය සඳහා විදේශගත වන අතර විදේශීය විශ්වවිද්‍යාල සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 400ක් පමණ ගෙවීම සිදුකරයි. (මූලාශ්‍රය- World University News)

දිනෙන් දින ඉහළ යන අධ්‍යාපන වියදම් සහ දරුවන්ගේ අධ්‍යාපනය සඳහා අරමුදලක් සැලසුම් කිරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් දේශයේ රක්ෂකයා වන ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් දරුවන් සඳහා දීප්තිමත් අනාගතයක් සුරක්ෂිත කිරීමට ඉඩ සලසමින් විශ්වසනීය රක්ෂණ විසඳුම ඉදිරිපත් කර තිබේ.

කාගිල්ස් ෆුඩ්සිටි - 38 වසරක අභිමානය !



කාගිල්ස් ෆුඩ්සිටි ආරම්භයේ සිටම ක්‍රියාත්මක වී ඇත්තේ සිය පාරිභෝගිකයින් හට අඩුම මිලට වැඩිම වටිනාකමක් ලබා දෙන අතරේ ගොවීන්ට සහ සුළු පරිමාණ ව්‍යාපාරකයින්ට වෙළෙඳ පොළක් නිර්මාණය කිරීම අරමුණු කරගනිමිනි.

සුපිරි වෙළඳසැල් අත්දැකීම ඉහළ පැළැන්තියට පමණක් සීමාවූ කාල වකවානුවක් වන 1983 වසරේ සිය මෙහෙයුම් ආරම්භ කළ ෆුඩ්සිටි වෙළඳසැල් ජාලය සමස්ත මහජනතාවට මෙම අත්දැකීම සමීප කරදීමේ පුරෝගාමියා බවට පත් වූහ. ආරම්භයේ පටන්ම ෆුඩ්සිටි හි අරමුණ වූයේ සිය පාරිභෝගිකයින්ගේ ජීවන වියදම අඩු කිරීමය. මෙම අරමුණ ඉටු කිරීම වෙනුවෙන් විවිධ වැඩසත් ආයෝජනයන් සිදු කර ඇති අතර මේ වනවිට සමාගම සතුව ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 තුළ ක්‍රියාත්මක වන ශාඛා 471 පවතී. පළමු ශාඛාව 1983 දී ස්ටේප්ල්ස් මාවතේදීද, 100 වන ශාඛාව 2007 දී කළුතරදීද, 200 වන ශාඛාව 2013 දී පිළියන්දලදීද, 300 වන ශාඛාව 2016 දී ඇල්පිටියේදීද, 400 වන ශාඛාව 2019 වත්තලදීද විවෘත කරන ලදී.

කාගිල්ස් සිය වෙළඳාම් ජාලය අංශ තුනක් කරා යොමු කර ඇත. ඒවා නම් ෆුඩ්සිටි සුපිරි වෙළඳසැල්, කාගිල්ස් එක්ස්ප්‍රස් වෙළඳසැල් සහ කාගිල්ස් ෆුඩ්හෝල් වෙළඳසැල් ය. එසේම ඉහළ යන ඔන්ලයින් ඉල්ලුමට සරිලන්නට කාගිල්ස් ඔන්ලයින් ආරම්භ කරනු ලැබුවේ 2020 දීය. අද වනවිට ෆුඩ්සිටි රටේ සුපතල නාමයක් බවට පත්වී ඇත්තේ විශ්වසනීය ප්‍රමිතිය, දිවයින පුරා නැමතැන ව්‍යාප්තව තිබීම, පහසුව සහ අඩුම මිල වෙනුවෙන් දැරූ විශ්වාසය නිසාවෙනි. අදවන විට ෆුඩ්සිටිහි අඩුම මිල සහතිකය දිවයින පුරා මිලගණන් සම්බන්ධයෙන් මිනුම් ලකුණක් බවට පත්ව ඇත.

හඟුරන්කෙත ප්‍රදේශයේ ගොවි ප්‍රජාව මුහුණ දෙන අභියෝගවලට සවන් දීම සඳහා සමාගමේ නිලධාරීන් 1999 වසරේදී කළ සංචාරයකින් පසුව දේශීය ගොවීන් සහ සුපිරි වෙළෙඳසැල් ජාලය අතර සෘජු සම්බන්ධතා ඇරඹිණි. එතැන් සිට කාගිල්ස් ෆුඩ්සිටි විසින් විවිධ සේවාවන් හඳුන්වාදෙමින් කෘෂි ව්‍යාපෘති හරහා ගොවියන්ව සවිබල ගන්වමින් සිටින්නේ ශ්‍රී ලංකාවේ විශාලතම පලතුරු සහ එළවළු එකතුකරන්නා බවට පත් වෙමිනි. රටපුරා පැතිර ඇති එකතු කිරීමේ මධ්‍යස්ථාන 11 කින් එකතු කරගන්නා නැවුම් අස්වැන්න පැය 24 ක් ඇතුළත ෆුඩ්සිටි ශාඛාවලට බෙදා හැරේ. ජාතික එළවළු සහ පලතුරු අස්වැන්නෙන් 2% කට වඩා වැඩි ප්‍රමාණයක් කාගිල්ස් ෆුඩ්සිටි සුපිරි වෙළඳසැල්වල අලෙවි වේ. සෑම දිනකම කාගිල්ස් විසින් නැවුම් අස්වැන්න මෙට්‍රික් ටොන් 120 ක් පමණ එකතු කරනු ලබයි.

චීන සමාගම ශාක නිරෝධායනයට එවූ එන්තරවාසිය ඉවත්කරගන්න

ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ කෘෂිකර්ම උපාධිධාරී සංගමයෙන් චීන තානාපතිට සන්දේශයක්

● **එච්.අයි. කුමාර**

කාබනික පොහොර සාම්පල් පරීක්ෂා කිරීමක් සම්බන්ධයෙන් චීන සමාගමක් විසින් ශාක නිරෝධායන සේවාවේ අතිරේක අධ්‍යක්ෂ වෙත එවා තිබෙන එන්තරවාසිය ඉවත් කර ගන්නා ලෙස අද (12දා) දින චීන තානාපතිවරයාට සන්දේශයක් භාරදීමට කටයුතු කරන බව ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ කෘෂිකාර්ම උපාධිධාරී සංගමය සඳහන් කරයි.

මෙම ඉල්ලීමට අමතරව චීන තානාපති කාර්යාලය ඉදිරිපිටදී විරෝධතා ව්‍යාපාරයක් පැවැත්වීමටද කටයුතු කරන බවත්, මේ සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණික වෘත්තීය සමිතිවල නියෝජිතයන් සහභාගී වන බවත් එම සංගමයේ ලේකම් ඩී.ආර්. කාංචන මහතා පැවසීය.

මෙම එන්තරවාසියට අදාළව ගැටලුව ඉදිරියට ගියහොත් අධිකරණ ක්‍රියාවලියක් දක්වා විය ඉදිරියට යා හැකි නිසා මෙම එන්තරවාසිය ඉල්ලා අස් කර ගන්නා ලෙස අදාළ සමාගමට දැනුම්දෙන ලෙස මෙම සන්දේශය මගින් ඉල්ලා සිටින බවද ඒ මහතා පවසා සිටියේය.

ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ කෘෂිකර්ම උපාධිධාරීන්ගේ සංගමය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පර්යේෂණ විද්‍යාඥයන්ගේ සංගමය, සමස්ත ලංකා කෘෂිකර්ම සේවා සංගමය, සමස්ත ලංකා කෘෂිකර්ම උපදේශකවරුන්ගේ සංගමය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පර්යේෂණ සහකාර සංගමය, රජයේ විද්‍යා හා කෘෂිකර්ම සංවර්ධන නිලධාරී සංගමය, වැඩසටහන් සහකාර (කෘෂිකර්ම) සංගමය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සහකාර සංගමය ඒකාබද්ධ වී මෙම ඉල්ලීම සිදුකරන බවද ඩී.ආර්. කාංචන මහතා පවසා සිටියේය.

විදෙස්ගත සේවා නියුක්තිකයන් රටට එවන මුදල්වලට, විශ්‍රාම වැටුප් ඇතුළු ප්‍රතිලාභ රැසක්

● **සමිල පෙරේරා**

විදේශයන්හි සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයන් විසින් මෙරටට සිදුකරන ප්‍රේෂණ ශ්‍රී ලංකාවට විදේශ විනිමය ගලාඒම වැදගත් ප්‍රභවයක් බැවින්, එම වැදගත්කම සැලකිල්ලට ගෙන විදේශයන්හි සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයන්ගේ සුභසිද්ධිය සඳහා වන නව දිරිගැන්වීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීමට අවශ්‍ය මූලික පියවර ගනිමින් සිටින බව ශ්‍රී ලංකා මහ බැංකුව පවසයි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කම්කරු අමාත්‍යාංශය, විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපොළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, දේශීය බැංකු අංශය සහ අනෙකුත් සියලුම අදාළ පාර්ශ්වයන් සමඟ මෙම වැඩසටහන සඳහා එක්ව තිබේ. ඒ අනුව මෙම දිරිගැන්වීමේ ක්‍රමවේදය යටතේ විදේශයන්හි සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයන් සඳහා වන විශ්‍රාම වැටුපක්/විශ්‍රාම ප්‍රතිලාභ හා හදිසි අනතුරු/ජීවිත රක්ෂණ ප්‍රතිලාභ මෙන්ම, අඩු පොලී නිවාස ණය සහ ස්වයං රැකියා සඳහා වන ණය ලබාදීම ඇතුළු බැංකු පහසුකම් සහ වඩා වැඩි අගයෙන් යුතු තීරු බදු සහන ලබාදීම යනාදී අංගයන් ඇතුළත් වේ. තවද එම දිරිගැන්වීමේ ප්‍රතිලාභවල මූල්‍ය වටිනාකම, අදාළ ශ්‍රී ලාංකිකයන් විසින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබූ විදේශ විනිමය ප්‍රමාණයට අනුපාතික වනු ඇත. ඒ අනුව, ඉහත දක්වනලද දිරිගැන්වීමේ ක්‍රමවේදයට අදාළ තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අදාළ රාජ්‍ය ආයතන හා බැංකු අංශය සමඟ එක්ව යථාකාලයේදී මහජනතාවට දැනුම් දෙනු ඇත.

එබඳු යෝජිත ප්‍රතිලාභ අත්පත් කරගනු වස්, විදේශගත ශ්‍රී ලාංකික සේවා නියුක්තිකයන්හට ඔවුන්ගේ විදේශ විනිමය ඉපැයීම් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කිරීමේදී විධිමත් බැංකු ක්‍රමවේදයද ඇතුළු විධිමත් මූල්‍ය හුවමාරු ක්‍රමවේදයක් භාවිත කරන ලෙසටත්, එකී මුදල් තමන්ගේ නමින් හෝ තමන්ගේ යැපෙන්නන් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුම්වලට ප්‍රේෂණය කරන ලෙසටත් ශ්‍රී ලංකා මහ බැංකුව විදෙස්ගත සේවා නියුක්තිකයන්ගෙන් ඉල්ලා සිටි අතර, එය ඉහත සඳහන් ප්‍රතිලාභ හිමි ලෙස ගණනය කිරීම සහ ඔවුනට ලබාදීම සඳහා අත්‍යවශ්‍ය වන බවද ශ්‍රී ලංකා මහ බැංකුව වැඩිදුරටත් පවසයි.

දැනුම, කුසලතා,
ආකල්ප, වඩවන
දැයේ දරුවන්ගේ
පුවත්පත

විජය

රු.40/-
සෑම අඟහරුවාදා
දිනකම නිකුත් වෙයි